අංක. 03.]

(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 මැයි මස 05 වැනි බදාදා පූ. භා. 9.30 ට**

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.05.04 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— උපදේශක කාරක සභා සහ ස්ථාවර කාරක සභා (ව්‍යවස්ථාදායක),—

(අ) මතු දැක්වෙන පරිදි උපදේශක කාරක සභා හතලිස් පහක් (45) පත් කළ යුතු ය.

පිළිවෙළින්:—

1. බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
2. රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
3. වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
4. ආපදා කළමණාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
5. සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
6. ඛනිජ තෙල් කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
7. ජල සම්පාදන හා ජලාපවහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
8. සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
9. පළාත් පාලන සහ පළාත් සභා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
10. පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
11. කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
12. ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
13. විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව

14. ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
15. රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
16. විදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
17. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
18. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
19. නැවත පදිංචි කිරීමේ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
20. තැපැල් හා විදුලි සංදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
21. ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
22. පරිසර කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
23. ළමා සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
24. අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
25. කම්කරු සබඳතා හා ඵලදායීතා ප්‍රවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
26. අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
27. වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
28. ධීවර හා ජලජ සම්පත් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
29. දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
30. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
31. ඉඩම් හා ඉඩම් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
32. සමාජ සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
33. ක්‍රීඩා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
34. කෘෂිකර්ම කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
35. ප්‍රවාහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
36. යෞවන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
37. සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
38. තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
39. මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
40. ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
41. ප්‍රජා සංවර්ධන හා පශු සම්පත් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
42. ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
43. වරාය හා ගුවන් සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
44. මහාමාර්ග කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
45. උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව

අංක 109 දරන ස්ථාවර නියෝගය අනුව කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වාර්තා කිරීම සඳහා එක් එක් උපදේශක කාරක සභාව පස් දෙනෙකුට (05) නොඅඩු සහ විසිපස් දෙනෙකුට (25) නොවැඩි මන්ත්‍රීවරුන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

එක් එක් උපදේශක කාරක සභාවක ගණපූරණය සඳහා මන්ත්‍රීන් තුන් දෙනෙකු (03) අවශ්‍ය විය යුතු ය.

(ආ) පිළිවෙළින් "ඒ" ස්ථාවර කාරක සභාව සහ "බී" ස්ථාවර කාරක සභාව යනුවෙන් හැඳින්විය යුතු ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා දෙකක් පත් කළ යුතු ය.

එක් එක් කාරක සභාවක් මන්ත්‍රීන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු අතර, යම්කිසි විශේෂිත පනත් කෙටුම්පතක් සලකා බැලීම පිණිස අතිරේක වශයෙන් මන්ත්‍රීන් පහළොවකට (15) නොවැඩි ගණනක් එක් කාරක සභාවකට පත් කිරීමට කථානායකතුමාට බලය තිබිය යුතු ය.

එක් එක් ස්ථාවර කාරක සභාවක ගණපූර්ණය සඳහා මන්ත්‍රීන් හතර දෙනෙකු (04) අවශ්‍ය විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ගෘහ්‍ය කාරක සභාව,— ස්ථාවර නියෝග 122 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, ගෘහ්‍ය කාරක සභාව, කථානායකතුමා සභාපති වූ ද තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් මන්ත්‍රීවරුන් දස දෙනෙකුගෙන් (10) සමන්විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 123 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, කථානායකතුමා සභාපති වූ ද, නියෝජ්‍ය කථානායකතුමා, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් මන්ත්‍රීවරුන් දස දෙනෙකුගෙන් (10) සමන්විත විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 124 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකතුමා සභාපති වූ ද, නියෝජ්‍ය කථානායකතුමා, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා, සභානායකතුමා, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් මන්ත්‍රීවරුන් විසි හතර දෙනෙකුගෙන් (24) සමන්විත විය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 125 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

7.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 126 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

8.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— වරප්‍රසාද පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 127 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් පහළොස් දෙනෙකුගෙන් (15) සමන්විත විය යුතු ය.

9.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 128 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් විසිනව දෙනෙකුගෙන් (29) සමන්විත විය යුතු ය.

10.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— උසස් නිලතල පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 128(අ) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් දහනව දෙනෙකුගෙන් (19) සමන්විත විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය,— (2010 මැයි 4). “ 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2010 මැයි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය. ”

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**